

ආයුර්වේද රෝහල

ඕස්ට්‍රේලියාවේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි
එකම බලයලත් ආයුර්වේද රෝහල

ඔබගේ සියලුම රෝග නිට්ටාවට
සුවකර ගැනීමට ප්‍රත්‍යක්ෂ
ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර හා
පංචකර්ම ප්‍රතිකාර

- ආමවාත ඇතුළු සියළුම සන්දිපත් රෝග
- පීනස් රෝග, සිසේ, ඇසේ රෝග
- සියළුම කෙඳුනාරටියේ හා තුනටියේ වේදනා
- සුදුකබර, පොතුකබර ඇතුළු සියළුම සමේ රෝග
- මානසික රෝග හා ඉරු රුදාව
- අර්ශස් රෝග හා මීමැරස්මෝරය
- ලිංගික අප්‍රානිකත්වය
- මුත්‍රාගල් හා වකුගඩු ඇතුළු මුත්‍රාශගත රෝග
- අකලට කෙස් පැසීම හා තට්ටය පෑදීම
- අම්ලපිත්තය, රන්පිත් ගත රෝග
- සියලුම පංචකර්ම චිකිත්සා

වසර 20ක ආයුර්වේද පලපුරුදු

ආයුර්වේද විශේෂඥ
වෛද්‍ය සන්තෝෂ් යාදේව් B.A MS, PGDAYDS, AAA
0410 914 987, (03)9774 7650

පංචකර්ම හා කැඩුම් බිඳුම් විශේෂඥ
දේශබන්දු වෛද්‍ය බන්දු දිසානායක DA (SRI LANKA)
0419 874 469

Medibank, AHM, HBF,
Australian Unity, Grand Unity
රක්ෂණ ආවරණ හිමියි

NO:41, BUCKLEY ST-NOBLE PARK, VI3174
NO:77, CANTERBURY ROAD, BLACKBURN, VIC3130
NO:125, STUD ROAD, DANDENONG, VI3175
www.ayurvedayoga.com.au

14 වන පිටෙන්

කෑවේ මමය. වසන් කල ලිංගිකත්වය අමුවෙන්ම දැනෙන ලෙස සමාජ ගත කිරීමට ලූෂන් අංකල් සමත් වෙයි. මට හිනා යනවා. කන් පෙත්තේ යටලීයේ උද ඉදන් විවාහයක් කරගන්නට බැරිව මැදිවියට ලංවෙමින් සිටින කෙනෙක් තමන්ගේ හිතගිය සහ අතීතයේ පෙම් කල කතුන් මෙනෙහි කරන එවුන්ගේ හිතේ ඇතිවන හැඟීම් ඔහු පෑනෙන් දියකර හරිනවා. අපි තුල තිබෙන හැදියාව සහ සම්ප්‍රදායන් බිඳින්නට තිබෙන අකමැත්ත නිසා අපි වර්තමානයේ කතා කලයුතු දැනුවත් විය යුතු සමහර මාතෘකා සම්බන්ධයෙන් අපි අනුගමනය කලේ නිහඬ පිළිවෙතක්.

ඔය වෙස්මුණ ගලවමු ලූෂන්

"දැනටමත් බුද්ධ සාසන අමාත්‍යංශය තුල නිකායන් 20 වඩා ප්‍රමාණයක් ලියාපදිංචි වී තිබෙනවා. දැන් බුදුහාමුදුරුවෝ මොන නිකායේද කියලත් හොයන්න වෙලා තියනවා. බුද්ධ සාසනය මෙතරම් නිකායන් වශයෙන් බෙදී වෙන්වී සිටීම තුළම පෙඩරල් ස්භාවයක් පවතිනවා" විටෙක ඔහුගේ සමාජ කතිකාව ඉතා අඝෝෂ අක්ෂර සමාජ කතාබහක් බවට පත්කරයි. සිතන්නට යමක් ඉතිරි කරයි. 77න් පසු බිහිවූ විධායකය මාධ්‍ය සදාචාරය පවා විනාශ කල බව කියන්න ඔහු බය නැත. මගේ ජීවිතයේ හොඳම කාලය ගෙවිලා ගියේ විධායක ජනාධිපති කියන  කියන නරක චරිතයත් එක්ක. මේ නරක චරිතය හීලෑ කරන්න කරන ආයාචනා තමයි කරන්න වෙන්නෙ. ඒක හීලෑ කරන්න ක්‍රමයක් නෑ. පාර්ලිමේන්තුව කැදවන්න. ප්‍රජාතන්ත්‍රවාදි විදියට වැඩ කරන්න . ප්‍රජාතන්ත්‍ර විරෝධිව වැඩ කරන්න එපා කියලා අපි ආයාචනා කරන්නේ අර නරක චරිතයට, විධායක මුට්ටියට ඔහු මොර දෙයි.

"පුතේ යෝගට් එකක් කනවද?" අනුලා ඇන්ටි අසයි. අනුලා ඇන්ටි ලස්සනයි හරි කටකාරයි. එයාගේ මහත්තයා ලූෂන් අංකල් ලූ, බුද්ධක ඇච්චා. ඒකාගේ අම්මා කේතලය ලිපේ තබා මතකය රත් කරයි. ලපටි දල්ලක රසයට වඩා අනුලා ඇන්ටිගේ මහත්තයාගේ කවි, ගීත රසයි, ගුණයි, දිවට නෙමේ නොමේරූ පොඩි ඇත්තෙක්ගේ කුඩා මොලයට පවා දැනෙයි.

කොළොම් තොට නැත මහළු වී
අවන් හල නැත පැරණි වී
එදා හඳමයි අදත් යෞවනයේ
එහෙත් අප දෙන්නා
බලන් කැඩපත සොඳුරියේ

අපේ වයස වැඩෙන්න වැඩෙන්න සිතේ පරිවර්තන ක්‍රියාවලියකුත් සිද්ද වෙනවා. බුදුහාමුදුරුවො ඒක අපූරුවට දශක චක්‍රයන් පෙන්වලා තියනවා. ඒ කියන්නෙ අවුරුදු 20 සිට 30 දක්වා වූ වර්ණවත් හද්‍රයොවුන්වියට "වර්ණ දශකය" කියනවා. අවුරුදු 30 සිට 40 දක්වා වූ කායික මානසික ශක්තිය පිරි අවධියට "බල දශකය" කියනවා. ජවයෙන් පිරුනු මේ දශක දෙක තුල අපි කරන කියන දෙවල් බොහොම වේග වත්.ඒ හින්ද සමහරවිට මොනවද කලේ කියල තේරුම් ගන්නකොට පරක්කු වැඩියි වෙන්ට පුළුන්.අවුරුදු 40 න් පස්සෙ තමයි තමන් කරපු දේවල් ගැන මෙනෙහි වෙන්ට පටන් ගන්නෙ.මොකද ඒ කාලය වෙනකොට දූ දරුවො ලැබිල තමන් වටේ වගකිම් පිරෙන්න පටන් අරගෙන.තරුණ තරුණයො අතරෙ තමන්ට හිමිව තිබුනු තැන නැතිවෙන්ට පටන් අරගෙන.අයිය ,අක්ක වෙනුවට මාම, නැන්ද කියල තමන්ට අමතන්න පටන් අරගෙන. කොහොමද ඒ තේරුම් ගැනීම. ඔන්න දැන් මේ වෙච්ච දේ ගැන කල්පනා කරනව.සත්‍යය තේරුම් ගන්න උත්සාහ කරනව.කල්පනා කිරීමේ ශක්තිය වඩනවා. ටිකන් ටික පරිණත බව සොයා යනවා.

ඔස්ට්‍රේලියාවට ආපු වේලාවක මතකය අවදී කලා. පේරාදෙණියේ ම පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලිපිකරු තනතුරක් ද කරමින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිසුවෙකු ලෙස ලූෂන් බුලත්සිංහල ඉගෙනුම ලබා ඇත්තේ මීට වසර පනහකට පෙර 1963-1967 පමණ කාලයේ දී ය. ඔහු මුලික අධ්‍යාපනය රත්මලාන ශ්‍රී ධර්මාලෝක විද්‍යාලයෙන්ද දෙහිවල මාධ්‍යම මහා විද්‍යාලයෙන්ද ලබා ගත් බවයි. අවසාන වසරේ දී ඔවුන් හැදෑරූ සිංහල සාහිත්‍යය වැනි විෂයක අවසාන දේශනය පවත්වා ඇත්තේ මනමේ, සිංහබාහු වැනි නාට්‍ය නිර්මාණය කළ
මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසිනි. තාරා දේවී සහ තාරාවෝ ඉගිලෙති ඔහුගේ ප්‍රකාශයන්ගේ ටෙලි සහ වේදිකාවේ ජනතාව වැලදගත් සොදුරු නිර්මාණයන්ය. වේදිකා නාට්‍යයක් හෝ වෙනත් නිර්මාණයක් නරඹා රස විඳීමට ද යම් කිසි බුද්ධි මට්ටමක් අවශ්‍ය බවත්, එවැනි තත්වයක සමාජයක් යනු සැම විටම සංස්කෘතියෙන් උසස් සමාජයක් බවත් ලූෂන් බුලත්සිංහල කලාකරුවා බුද්ධකට පවසයි.

ලූෂන් බුලත්සිංහල ගොඩ නගන "වෙස්මුණ ගලවන්න" වෙදිකා නාට්‍යයට මේ දිනවල සම වදිමින් සිටී

ඔය වෙස්මුණ ගලවමු ලූෂන්

පරාක්‍රම නිරිඇල්ලයි, කේමදාස මාස්ටර් එක්ක කාරෙකේ යන ගමන් පදවැල් කිහිපයක් කියවනවා.

ලිහිල් සළුව අනතුරේ වැටෙද්දී
පයෝධර තුඩු ඉකිබිඳිද්දී
සංත්‍රාසයෙන්
අසංවාදී සුසුම් වේගේ රිද්මයෙන්
වයන්න වීනා ... කන්‍යාවී...

පදවැල අහගෙන හිටපු මාස්ටර් කකුලෙන් හිටගෙන තිරිංග තද කරනවා. "මරණ තුනක් ඇති මිනිසා බලා සිටී.. ඒක තමයි ලයින් එක. ලූෂන් එතනින් සිංදුව පටන් අරන් ආපහු ලියන්න" මාස්ටර් කියයි. අමරසිරි කියයි. සිරිමැදුර සම්මාන ගනී. අනෝජා විලාප දෙයි. කන්‍යාවී පලා යයි. මා හඬවාපන් මේ රෑ යාමේ මම යටලියේ නාරිලතා මලට සිහිනෙන් කියයි. මා හඬවාපන් මේ රෑ යාමේ... අහමඩ් දැන් රට සුරුට්ටු බොයි.

ප්‍රවීණ ගේය පද රචක සහ ප්‍රතිභා පූර්ණ රංගනවේදී ලූෂන් බුලත්සිංහලයන්ට චිරං ජයතු

"සැබෑ පෙම්වතුන් කිසිදාක එක නොවේත්ව එක්වූ කිසිවෙකුත් සැබෑ පෙම්වතුන් ලෙස ජීවත් නොවේ..
වෙන් වී ගියවුන් සදාකාලික පෙම්වතුන් ලෙසම ජීවත් වේ" ලූෂන් බුලත්සිංහල මට කියයි. ඔබයි පුංචි කාලිදාස
ඔය වෙස්මුණ ගලවමු ලූෂන්